ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./දැ.ප./ලි/001

ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි — යොමු අංකය 1617-015
2016 දෙසැම්බර් 04

දයාබර දෙමාපියන් වෙත,

දහම් පාසලේ 2016-2017 අධ්‍යයන වසරේ සිට ආරම්භ කරන්නට යෙදුනු වාර (sessions) තුනක පන්ති පැවැත්වීම නිසා එක වාරයක අවසානයේ සිට අනෙක් වාරයේ ආරම්භය දක්වා ඇති කාලය පැය භාගයකට සීමා කරන්නට සිදුවිය. මෙම සීමාසහිත කාල වෙලාව ඇතුලත පන්ති වල මේස සහ බැංකු සකස් කර ගැනීමට වැඩි දෙනෙකුගේ සහයෝගය අවශ්‍ය වී ඇත. දෙමාපියන්ගේ සහයෝගය නොලැබෙන නිසා, දහම් පාසලේ ගුරුවරියන් විසින් මෙම වැඩ කොටස සිදුකිරීමට සිදුවී ඇති බව ඉතාමත් කනගාටුවෙන් දැනුම් දෙමු.

මෙම කර්තව්‍යය ඉක්මණින් නිමකරගනීම සඳහා දෙමාපියන්ගේ සහයෝගය ලබා ගැනීමට අපේක්ෂා කරමු. පහත සඳහන් කාල සටහන අනුව අදාළ පන්තිවල දරුවන්ගේ දෙමාපියන් හට දහම් පාසල් ශාලාව තුලට පැමිණ ඔබගේ දරුවන් රැගෙන යාමට පෙර පන්ති වල මේස සහ බැංකු සකස් කර දෙන මෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමු. මේ සඳහා ඔබගෙන් ලැබෙන සහයෝගය අප ස්තුතිවන්ත වෙමු. පන්තියේ සියලුම දරුවන්ගේ දෙමාපියන්ගේ සහයෝගය ලදහොත් මෙම කාර්යය විනාඩි 10 කට වඩා අඩු කාලයකින් නිම කරගත හැකි වනු ඇත.

**දහම් පාසලේ පන්තිවල මේස සහ බංකු සකස් කිරීම**

| වාරය | වෙලාව | සටහන | දිනය | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | දෙසැම් 9 | දෙසැම් 16 | දෙසැම් 23 | ජනවාරි 6 | ජනවාරි 13 |
| උදය වරුව | පෙ ව. 8.30 ට (බුද්ධ වන්දනාව අවසානයේදී )<br>පෙ ව.11.15 ට (පන්ති අවසානයේදී) | අදාළ පන්තියේ දරුවන්ගේ දෙමාපියන් උදෑසන බුද්ධ වන්දනාව අවසානයෙදී සහ පාසල් වාරය අවසානයේදී සියලුම පන්තිවල මේස සහ බංකු සුදානම් කරන්න/පන්ති වලින් ඉවත් කර ශාලාව පිරිසිදු කරන්න. | 5-1 පන්තිය | 6-1 පන්තිය | 6-2 පන්තිය | 7-1 පන්තිය | 7-2 පන්තිය |
| දහවල් වරුව | ප ව. 3.00 ට (පන්ති අවසානයේදී) | අදාළ පන්තියේ දරුවන්ගේ දෙමාපියන් පාසල් වාරය අවසානයේදී ප ව 3.00ට සියලුම පන්තිවල මේස සහ බංකු ඉවත් කර ශාලාව පිරිසිදු කරන්න | 2-1 පන්තිය | 2-2 පන්තිය | 2-3 පන්තිය | 2-4 පන්තිය | 3-1 පන්තිය |
| සවස් වරුව | ප ව. 6.25 ට (පන්ති අවසානයේදී) | අදාළ පන්තියේ දරුවන්ගේ දෙමාපියන් පාසල් වාරය අවසානයේදී ප ව. 6.25 ට සියලුම පන්තිවල මේස සහ බංකු ඉවත් කර ශාලාව පිරිසිදු කරන්න | 1-4 පන්තිය | 1-5 පන්තිය | 1-1 පන්තිය | 1-2 පන්තිය | 1-3 පන්තිය |

**සටහන:**

**දරුවන්ගේ පහසුව සඳහා දහම් පාසල් අවසානයේදී ඔබ පැමිණෙන තුරු ඔබෙගේ දරුවන් දහම් පාසලේ නැවතී සිටිනු ඇත. ඔබට පැමිණීමට අපහසුනම් දරුවා පාසලෙන් පිටතට එවීම සඳහා කරුණාකර අපට දන්වා එවන්න.**

ස්තුතියි,
සංවිධායක මණ්ඩලය

Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org